වතාරික සමයේ සතරවන සතිය
අඟහරුවාදා

පළමුවන කියැවීම

එසෙකියෙල් දිවැස්ප්‍රසාදිතුමන්ගේ පොතෙන් ගත් පාඨයෙකි.

එසෙකියෙල් 47: 1–9, 12

දේව මාලිගය තුළින් ගලා ආ ජල දහර ජීවනය දෙයි.

පසුව ඒ මනුෂ්‍යයා දේව මාලිගාවේ දොරකඩ ළඟට මා නැවත පැමිණෙව්වේ ය. එවිට දේව මාලිගාවේ එළිපත්තට යටින් නැගෙනහිර දෙසට වතුර ගලා යන බව මම දිටිමි. මන්ද දේව මාලිගාවේ ඉස්සරහ පැත්ත නැගෙනහිර දෙසට තිබුණේය. ඒ වතුර දේව මාලිගාවට දකුණු පැත්තෙන් පූජාසනයට දකුණින් එළිපත්ත යටින් ගලා ආවේය. එකල ඔහු මා උතුරු ද්වාර මණ්ඩපයෙන් පිටතට ගෙන ගොස් නැගෙනහිරට මුහුණ පා තිබුණු පිටත දොරටුව ළඟට වටකරින් මා පැමිණෙව්වේය. එවිට වතුර දකුණු පැත්තෙන් වැගිරෙනු දිටිමි. ඒ මනුෂ්‍යයා තමාග් අතින් ලණුව රැගෙන නැගෙනහිර දෙසට යමින් මීටර් පන්සියයක් මැන්නේය. එවිට ඔහු මට වතුර මැදින් එගොඩට යන්න කීවේය. වතුර දණහිස් දක්වා තිබුණේය. ඔහු තව මීටර් පන්සියයක් මැන වතුර මැදින් මා යැව්වේය. එතැන වතුර ඉඟටිය දක්වා තිබුණේය. ඔහු තව මීටර් පන්සියයක් මැන්නේය. එවිට එය මට බැස යන්නට බැරි ගඟක්ව තිබුණේය. මන්ද, බැස යන්නට බැරි ගඟක්ව පීනන්නට වුවමනා තරමට වතුර ඉහළට නැඟ තිබුණේය. එවිට ඔහු කතා කරමින් "මනුෂ්‍ය පුත්‍රය, නුඹ මෙය දුටුවෙහි දැ"යි මාගෙන් අසා මා කැඳවා ගෙන නැවත ගං ඉවුරට පැමිණෙව්වේය. මම හැරී ගිය කල ගං ඉවුර දෙපැත්තේම බොහෝ ගස් තිබෙනු දුටිමි. ඔහු

කතා කරමින් "මේ වතුර නැගෙනහිර දිසාවට ගලා ගොස් අරබා සමභූමියට බැස ගොස් එහි මළ මුහුදට ඇතුල් වූ විට ජලය මිරිදියට හැරුණේය. මේ ගංගා ගලා යන සෑම තැනම රාශි ගණන් පණ ඇති සියලුම සත්ත්වයෝ ජීවත් වන්නෝය. එසේ මත්ස්‍යයන් මහා ගණනක් හටගනු ඇත. මන්ද මේ වතුර එහි පැමිණුන විට අනික් ඒවා මිරිදිය වන්නේය. ගංගාව ගලා යන කොතැනක වුව ද සිටින සියල්ලන් ජීවත්ව සිටිනු ඇත.

ගඟ ඉවුරේ දෙපැත්තෙන්ම සියලු ආකාර පළතුරු වැවෙන්නේය. ඒවායේ කොළ වේලෙන්නේ වත් ඒවායේ පල වරන්නේ වත් නැතිව හැම මාසයේම අලුත් පල දරන්නේය. මන්ද ඒවායේ වතුර ශුද්ධ ස්ථානයෙන්ම නික්ම එන්නේය. ඒවායේ පල ආහාර පිණිසත් ඒවායේ කොළ ඖෂධ පිණිසත් වන්නේ ය"යි කීය.

දේව වාක්‍යය එසේය.

පිලිතුරු ගීය

ගීතාවලිය 46: 1 – 5, 7 – 8

පිලිතුර: සව් බලැති දෙව් සමිඳාණෝ අප සමඟ ය.

ගීය:

දෙවිඳාණෝ අපේ ශක්තිය හා සරණය වන සේක. හැමදා විපතේ දී අප හට පිලිසරණක් වන සේක. මහ පොළොව කම්පා වෙතත්, කඳු වැටී මහ මුහදට කඩා වැටෙතත්, සත් සමුදුර ගුගුරා කැලඹෙතත්,

එයින් නැගෙන රැළ වේගයෙන් කඳු වැටී සැලෙනත් අපට කිසි විටක බියක් නැත.

එක් ගංගාවක් ඇත. එහි දිය පාරවල් ගලා ගොස් අපේ උතුම් දෙවිඳුන්ගේ ශුද්ධ මණ්ඩපය වන දෙව් නුවරට සංතොස ගෙන දෙයි. දෙව් තුමාණෝ ඒ නුවර වැඩ වසන සේක. ඊට කිසිදා විපතක් නොවනු ඇත. දෙව් තුමාණෝ අලුයම් වේලෙහි ඊට පිහිට වන සේක.

සව් බලැති, සමිඳාණෝ අප සමග ය. ජාකොබ්ගේ දෙවිඳාණෝ අපේ බලකොටුව ය. එන්න සමිඳුන්ගේ වික්‍රම ක්‍රියා බලන්න. මිහි මත කර ඇති පුදුම ක්‍රියා තරඹන්න.

සාධුකාරය

ජීවත් වන පිණිස නපුර නොව යහපත සොයන්න.
එවිට සියලු බලැති දෙව් ස්වාමීන් වහන්සේ ඔබ සමග වැඩ සිටින සේක.

සුවිශේෂය

සුවිශේෂක ජුවාම් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

ජුවාම් 5 :1–3, 5–16

මිනිසා සුවපත් වී සිය පැදුර ද රැගෙන යන්නට ගියේය.

ජුදෙව්වරුන්ගේ මංගල්‍යයක් විය. ජේසුස් වහන්සේ ද ජෙරුසලමට වැඩම කළ සේක. ජෙරුසලමෙහි බැටළු දොරටුව ළඟ හේබ්‍රෙව් බසින්

‘බෙතෙස්දා’ යයි නම් ලත් පොකුණක් විය. එය අවට ද්වාර මණ්ඩප පහක් විය. ඒවායෙහි අන්ධ වූ ද කොර වූ ද අංශබාග වූ ද රෝගීන් සමූහයක් ඔත්පළ ව සිටියෝය. එහි තිස් අට අවුරුද්දක් රෝගීව සිටි එක් මිනිසෙක් විය. ඒ මිනිසා හාන්සි වී සිටිනු ජේසුස් වහන්සේ දැක “ඔහු බොහෝ කලක් එහි සිටි බව දැන ඔබ සුව වීමට කැමැති දැ”යි ඔහුගෙන් ඇසූ සේක. රෝගියා උන් වහන්සේට උත්තර දෙමින් “ස්වාමිනී, වතුර කැළඹෙන විට මා පොකුණට බස්සවන්නට කිසිවෙක් නැත. මා එන අතර අන් කෙනෙක් මට පළමුවෙන් බසින්නේ යැ”යි කීවේය. “නැගිට ඔබේ පැදුර රැගෙන යන්නැ”යි ජේසුස් වහන්සේ ඔහුට වදාළ සේක. එකෙණෙහිම මිනිසා සුවපත් වී සිය පැදුර රැගෙන යන්නට ගියේ ය. එය සබත් දවස විය. එබැවින් ජුදෙව්වරු “අද සබත් දවස ය. පැදුර රැගෙන යාම නීති විරෝධී ය” යි සුවය ලැබූ මිනිසාට කීය. එහෙත් ඔහු ඔවුන්ට පිළිතුරු දෙමින් “මා සුවපත් කළ තැනැත්තා ම ‘ඔබේ පැදුර රැගෙන යන්න’යි මට කීවේය”යි කීහ. ‘පැදුර රැගෙන යන්නැ’යි ඔබට කී මිනිසා කවරෙක් දැ”යි ඔව්හු විමසූහ. එහෙත් සුවපත් කරනු ලැබූ මිනිසා ඔහු කවරෙක් දැයි නොදත්තේය. මන්ද ඒ ස්ථානයේ සමූහයා අතුරින් ජේසුස් වහන්සේ සොයාගත නොහැකි වූ බැවිනි. ඉන්පසු ජේසුස් වහන්සේ දේව මාළිගාවේ දී ඔහු මුණ ගැසී “බලන්න ඔබ සුවපත්වී ඇත. මීට වඩා භයානක දෙයක් සිදු නොවන පිණිස තවත් පව් නොකරන්නැ”යි වදාළ සේක. ඒ මිනිසා ද ගොස් තමා සුවපත් කළේ ජේසුස් වහන්සේ බව ජුදෙව්වරුන් හට සැළ කළේය. ජේසුස් වහන්සේ මෙවැනි දේ සබත් දවසේ දී කළ බැවින් ජුදෙව්වරු උන් වහන්සේට පීඩා කළහ.

සුවිශේෂ වාක්‍යය එසේ ය.